Article

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

12(1). # இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

12(1) # HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2020-11-11 |

පැමිණිලිකරුවන් : 01 එම්.එස්.එම්. රියාස් මයා

02 එම්.එස්.එම් අජ්මීර් මයා

03 එම්.එස්.එම් නවාස් මයා

යගම්වෙල,

දුම්මලසූරිය.

වගඋත්තරකරුවන් : කේ.ආර්. අජිත් ප්‍රියන්ත මයා

මූලස්ථාන පොලිස් පරික්ෂක

මූලස්ථාන පොලිසිය,

කුලියාපිටිය.

<u>පැමිණිලි අංක</u> : **<u>HRC/4347/16</u>**

පැමිණිල්ල :-

උක්ත පැමිණිලිකරුවන් විසින් මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, 2016.10.20 වන දින පෙරවරු 8.00 ට පමණ තමාගේ කුලියාපිටිය පිහිටි කඩයට ගිය අවස්ථාවේදී එම කඩ කාමරයේ පිටුපස ආරක්ෂාව සඳහා සවිකර තිබූ ගේට්ටුව කඩා පොලිසියට රැගෙන ගොස් තිබූ බවත්, ඒ සම්බන්ධයෙන් පොලිසියට ගොස් විමසා සිටි අවස්ථාවේදී නිසි පිළිතුරක් නොදී පොලිසියේ මදක් රැඳී සිටින ලෙසට උපදෙස් දුන් බවත්, ටික වේලාවකට පසුව තුහුමාන් සහ හපිල් යන දෙදෙනාම එම ස්ථානයට පැමිණි බවත් ඉන්පසුව එම අයගෙන් පමණක් ප්‍රකාශයක් සටහන් කර ගෙන තමා සහ තම සහෝදරයා වන අජ්මීර් යන දෙදෙනාම අත්අඩංගුවට ගෙන පසුදින පස්වරු 2.30 ට පමණ කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කල බවත්, කිසිදු හේතුවක් ඉදිරිපත් නොකර මෙසේ අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරිම මත තමන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට පැමිණිල්ලේ සඳහන් කර ඇත.

පැමිණිලිකරු වැඩිදුරටත් මේ සම්බන්ධයෙන් සඳහන් කර ඇත්තේ, තුහුමාන් යන අය විසින් තමන්ට අයිති කඩකාමරයේ උඩුමහලේ බලහත්කාරයෙන් පදිංචිව සිටින බැවින් ඔහු කෙසේ හෝ එහෙයින් ඉවත් කිරීමේ අරමුණින් 2016.10.19 වන දින රාත්‍රී 10.00 ට පමණ තුහුමාන් යන අයට


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541 / 74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 -11- 2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

උඩුමහලට යාමට නොහැකි වන පරිදි ගේට්ටුවක් රැගෙන ඇවිත් සවිකර නැවත නිවසට පැමිණි බවයි.

තවද මෙසේ අත්අඩංගුවට ගත් තමන් දෙදෙනාගෙන්ම ප්‍රකාශයන් ලබා ගත්තේ අධිකරණයට ඉදිරිපත් කිරීමට සුළු මොහොතකට පෙර බවත් පොලිස් සිරමැදිරියේ සිටි අවස්ථාවේදී නුහුමාන් යන අය තවත් කිහිපදෙනෙකු සමග පැමිණ ලක්ෂ 10 ක මුදලක් ලබා දුනහොත් මෙම පැමිණිල්ල අවසන් කළ හැකි බව සඳහන් කර සිටි බවත් දන්වා ඇත.

අත්අඩංගුවට ගත් අවස්ථාවේදී වෙනත් කිසිදු තැනැත්තෙකු හෝ අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය බව පොලීසිය විසින් සඳහන් කර නොතිබුණද තමන් දෙදෙනා අත්අඩංගුවට ගෙන දින දෙකකට පසුව අනෙක් සහෝදරයාද ඇතුළු තවත් හතරදෙනෙකු අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය බව වරින් වර පවසා සිටි බවත් එම සියලුදෙනාම අත්අඩංගුවට ගැනීමට සූදානම්ව සිටි අවස්ථාවේදී ද මෙම නුහුමාන් යන අය විසින් ලක්ෂ 10 ක මුදලක් ලබා දෙන්නේ නම් මෙය සමථයට පත් කළ හැකි බව සඳහන් කළ බව තවදුරටත් සඳහන් කර ඇත.

තමන් අත්අඩංගුවට ගැනීමෙන් පසුව මෝටර් රථයද පොලිස් භාරයට ගත් බවත්, එය නිදහස් කර දීමටද ලක්ෂ 10 ක මුදලක් ඔහු විසින් ඉල්ලා සිටින ලද බවත්, තමන් විසින් සවිකර තිබූ ගේට්ටුව නොදන්වා ගලවා ගෙන ගොස් තඩු පැවරීම සිදුකරන ලද බවත් මෙම කරුණු හේතුවෙන් තමා ඇතුළු සහෝදරයන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් සඳහන් කර ඇත.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

සිතාසි ප්‍රකාරව 2017.01.23 වන දින දෙපාර්ශවය කැඳවූ අතර වගඋත්තරකරු නියෝජනය කරමින් පැමිණ සිටි උ.පො.ප හේරත් මහතා ප්‍රකාශ කර ඇත්තේ, 2016.10.20 වන දින පැය 8.00 ට පමණ නිවසක් බිඳ රු. 53,000 ක මුදලක් සහ දේපල සොරා ගැනීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් මොහොමඩ් නුහුමාන් යන අය විසින් සිදු කර තිබූ බවත්, එම පැමිණිල්ලේ සඳහන් වී ඇත්තේ එකී නිවස බිඳ ඇත්තේ අජ්මීර් සහ රියාස් යන දෙදෙනා සමග තවත් පිරිසක් බවට දන්වා ඇති බවත්ය. ඒ අනුව තමා විසින් විමර්ශන කටයුතු සිදුකර ඇති බවත් මොහොමඩ් නුහුමාන් යන අය පදිංචි නිවස පිහිටා තිබුණේ ඔහු විසින් පවත්වා ගෙන යන CD කඩ කාමරයේ ඉහල මහලයේ බවත් සඳහන් කර ඇත.

නිවසට යන මාර්ගය හරස් කර යකඩ දොරක් දමා වසා තිබුණු ලකුණු දක්නට තිබූ අතර එම දොර නුහුමාන් විසින් ගලවා ඉවත් කර තිබූ බවත්, තමා විසින් නුහුමාන් පදිංචිව සිටින නිවස පරීක්ෂා කරන විට නිවසට ඇතුළු වන දොරෙහි අගුල ගලවා ඇතුලත ගෘහ උපකරණ බිමට පෙරලා දමා තිබුණු බවත්, අල්මාරියේ යතුරු තහඩුව කඩා ඇතුලත තිබූ බඩු එළියට ඇද තිබූ

බවත් සඳහන් කර ඇත. තවද අපරාධ ස්ථාන පරීක්ෂණ භාර නිලධාරීත්ව කැඳවා මෙම ස්ථානයේ වැඩිදුර විමර්ශනය සිදු කළ බවත් නිවසට යන මාර්ගය හරස් වන ආකාරයට යොදා තිබූ දොර තමා විසින් නඩු භාණ්ඩ ලෙස දේපල කුවිතාන්සි අංක 831/16 යටතේ පොලිසියට ඉදිරිපත් කළ බවත්, පැමිණිල්ලේ සඳහන් ආකාරයට පුද්ගලික නගර ආරක්ෂක අංශයේ ස්ථාන භාර නිලධාරි රංජිත් සමරසිංහ මහතාගේ ප්‍රකාශ සටහන් කළ බවත් පැමිණිලිකරුගේ ප්‍රකාශයට අනුව සහ විමර්ශනය අනුව සැකකරුවන් වන මෙම පැමිණිල්ලේ සඳහන් එම්. අජ්මීර් සහ එම්. රියාස් යන දෙදෙනාම අපරාධයට සැකපිට අත්අඩංගුවට ගෙන 2016.10.21 වන දින කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත නඩු අංක බී/2141/16 යටතේ ගරු මහේස්ත්‍රාත්තුමා වෙත ඉදිරිපත් කළ බවත් සඳහන් කර ඇත.

පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-

මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණය සඳහා පැමිණ සිටි කුලියාපිටිය පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක අජිත් ප්‍රියන්ත මහතා සඳහන් කර ඇත්තේ, නුහුමාන් යන අය විසින් දේපල කොල්ලකෑමක් සම්බන්ධව පැමිණිල්ලක් 2016.10.20 වන දින පැය 8.00 ට ලැබුණු බවත්, එම පැමිණිල්ලට අනුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් විමර්ශනය සිදු කර විමර්ශනයෙන් අනාවරණය වූ කරුණු වලට අනුව නුහුමාන් යන අයගේ නිවසේ දොර කඩා දේපල සොරකම් කිරීමට තිදෙනෙකු සම්බන්ධ වූ බව CCTV දර්ශන අනුව පෙනී ගිය බැවින් එම තිදෙනා වන අජ්මීර්, රියාස් සහ නවාස් යන අය අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ බවත්ය.

වගඋත්තරකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, CCTV දර්ශන වලට අනුව ඉහත සඳහන් තිදෙනා සහ තවත් පිරිසක් විසින් ගේට්ටුවක් වාහනයකින් රැගෙනවිත් පිටුපසට රැගෙන යන දර්ශන තිබෙන බවත් නුහුමාන් යන අයගේ නිවසේ දොර කඩන දර්ශන කිසිවක් පෙනෙන්නට නොතිබුණු බවත්ය.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් නගරයේ ආරක්ෂක නිලධාරීන්ගෙන් ගත් ප්‍රකාශය මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන අතර, වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගැනීමට තීරණය කර ඇත්තේ මෙම පැමිණිලිකරුවන් රාත්‍රී 12.00 න් පසුව අදාල ස්ථානයට ගේට්ටුවක් සවි කිරීම සඳහා ගිය CCTV දර්ශන තිබූ බැවින් වන බවයි.

තවද මෙම අත්අඩංගුවට ගත් පිරිසගේ ඇඟිලි සටහන් ලබා ගත්තාද යන්න විමසූ අවස්ථාවේදී වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියේ ඇඟිලි සටහන් ලබා ගෙන ඇඟිලි සටහන් ලියාපදිංචි කාර්යාලය වෙත යොමු කළ බවත්, එම කාර්යාලයේ වාර්තාවට අනුව මෙම පැමිණිලිකරුවන්ගේ ඇඟිලි සටහන් එහි නොතිබුණු බවත්ය.

**පැමිණිල්ලේ වැඩිදුර විමර්ශනය සඳහා නගරයේ ආරක්ෂක අංශයේ ප්‍රධානියා වන රංජිත් සමරසිංහ මහතාගෙන් ලබා ගත් ප්‍රකාශය :-**

2017.01.30 වන දින කුලියාපිටිය නගරයේ ආරක්ෂක අංශයේ සේවය කරන ප්‍රධාන ආරක්ෂක නිලධාරි වන රංජිත් සමරසිංහ මහතා කොමිෂන් සභාවට පැමිණ ප්‍රකාශයක් ලබා දී ඇත. ඔහුගේ ප්‍රකාශයට අනුව තමාට අත්සන් කිරීම සඳහා උඩුමහලට යාමට නොහැකිව ගේට්ටුවක් සවිකර තිබූ බැවින් රාත්‍රී 2.00 ට පමණ තුහුමාන් යන අයට දුරකථන ඇමතුමක් ලබා දීමෙන් පසුව එම ස්ථානයට පැමිණ නැවත පොලිසියට ගිය බවත්, නැවත විනාඩි 30 කට පසුව පැමිණ තුහුමාන් විසින්ම ගේට්ටුව කඩා ඉවත්කර අප හට අත්සන් කරන ලෙස උපදෙස් දුන් බවත් එම අවස්ථාවේදී නිවසේ දොරකඩා සොරකමක් සිදුව ඇති බවට කිසිදු ප්‍රකාශයක් නොකළ බවත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

මෙම පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගැනීමේදී අදාල අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූල ක්‍රියාපටිපාටියට අනුව සිදුව ඇතිද යන්න මෙහිදී මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

2016.10.20 අලුයම 2.00 ට පමණ තුහුමාන් යන අය අදාල ස්ථානයට පැමිණ පොලිසියට ගොස් පැමිණිල්ලක් කළ බවට පවසා පිටව ගොස් නැවත විනාඩි 30 කට පසු පැමිණ ඇතත් එම අවස්ථාවේදී පැමිණිල්ලක් කර නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව අලුයම 2.00 ට පොලිසියට ගොස් පැමිණිල්ලක් කර නොතිබීම ගැටලු සහගත කාරණාවකි. එයට හේතුව ඔහු පැමිණිල්ල කර ඇත්තේ පසුදින 2016.10.20 දින පැය 8.00 ට බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුවන් සහ තුහුමාන් යන අය අතර උඩුමහලේ ඇති කඩකාමරය සම්බන්ධයෙන් ආරවුලක් පවතින බව නිරීක්ෂණය වන අතර, පැමිණිලිකරු විසින් තුහුමාන් යන අය පදිංචි ස්ථානයට යෑම වැලැක්වීමේ අරමුණින් ගේට්ටුවක් ගෙනවිත් සවිකර ඇති බව ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව නිරීක්ෂණය වේ.

අදාල ගේට්ටුව සවිකර ඇති බව රාත්‍රී මුර සංචාරයේ සිටින පුද්ගලික නගර ආරක්ෂක නිලධාරි විසින් තුහුමාන් යන අයට දැනුම් දීමෙන් පසුව ඔහු එම ස්ථානයට පැමිණ නැවත පොලිසියට ගොස් ඇති බවත් තුහුමාන් යන අය විසින්ම ගේට්ටුව කඩා ඉවත් කර ඇති අතර එම අවස්ථාවේදී සොරකමක් සිදු කර ඇති බවට පුද්ගලික නගර ආරක්ෂක නිලධාරි වෙත දන්වා නොමැති බව පුද්ගලික නගර ආරක්ෂක විසින් පොලිසිය වෙත ලබා දී ඇති ප්‍රකාශයෙන් සහ මානව හිමිකම් කොමිෂන් සභාවට ලබා දී ඇති ප්‍රකාශයෙන් අනාවරණය වේ.

පැමිණිලිකරුවන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති CCTV කැමරා දර්ශනයට අනුව පැමිණිලිකරුවන් විසින් ගේට්ටුවක් රැගෙන යන බව නිරීක්ෂණය වන නමුත් ඔවුන් විසින් දොර කඩන බවට කිසිදු ඡායාරූප සටහන් නොමැති බව නිරීක්ෂණය වේ. එය වගඋත්තරකරුගේ ප්‍රකාශයෙන්ද සනාථ වේ.

පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගැනීමට පෙර පොලිස් නිලධාරීන් විසින් නිසි විමර්ශනයක් සිදුකර නොමැති අතර පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගැනීමට කරුණු පරීක්ෂා කිරීමෙන් තොරව පැමිණිල්ල මත පමණක් පදනම්ව මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කළ පැමිණිලි පාර්ශවය 2016.10.20 වන දින පෙරවරු 8.00 ට පමණ පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කිරීමට ගිය අවස්ථාවේදී ඔවුන් අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වන අතර. පාර්ශවයන් දෙකම පැමිණිලි කිරීමට එකම අවස්ථාවේදී පොලිස් ස්ථානයට ගොස් ඇති බැවින් එම පැමිණිලි දෙකම එකට ගෙන විභාගයක් කිරීමට අවස්ථාවක් තිබූ නමුත් එසේ නොකර ඇති බවද නිරීක්ෂණය වේ.

කුලියාපිටිය මූලස්ථාන පොලිස් පරීක්ෂක මගින් 2017.05.30 වන දින කොමිෂන් සභාව ඉදිරියේ ලබා දුන් ප්‍රකාශයට අනුව පැමිණිලිකරුවන්ගේ ඇඟිලි සලකුණු කිසිවක් අපරාධ ස්ථානයේ සටහන් වී ඇති බවට සාක්ෂි නොමැති බවද ප්‍රකාශ කර ඇත.

ඒ අනුව පැමිණිලිකරුවන් විසින් අදාල ගොඩනැගිල්ලට ගේට්ටුවක් ගෙන ගොස් සවිකර නුහුමාන් යන අයගේ නිවසට යාම අවහිර කර ඇති බවට සාක්ෂි ඇතත්, නුහුමාන් යන අයගේ නිවසේ දොරකඩා භාණ්ඩ සොරකම් කල බවට කිසිදු සාක්ෂියක් පොලිස් නිලධාරීන් වෙත අනාවරණය කරගෙන නොමැති බව නිරීක්ෂණය වේ.

මේ අනුව පැමිණිලිකරුවන් හා නුහුමාන් යන අය අතර ඇති පුද්ගලික ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් ආරවුල පදනම් කර ගෙන මෙම පැමිණිල්ල ව්‍යාජ ලෙස ඉදිරිපත් කර ඇති බවට පැමිණිලිකරුවන් විසින් කර ඇති ප්‍රකාශය බැහැර කිරීමට ප්‍රමාණවත් සාක්ෂි වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර නොමැත.

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගත්තද එය හුදෙක් පැමිණිල්ල මත පදනම්ව කරන ලද අත්අඩංගුවට ගැනීමක් බවත් සාක්ෂි මත පදනම්ව සිදු කරන ලද අත්අඩංගුවට ගැනීමක් නොවන බවත් නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඉහත නිරීක්ෂණ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී මෙම අත්අඩංගුවට ගැනීම නිසි විමර්ශනයකින් තොරව අත්තනෝමතික ලෙස සිදුව ඇති බැවින්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) හා 12(1) ව්‍යවස්ථා මගින් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවීය මූලික අයිතිවාසිකම් වගඋත්තරකරුවන් විසින් උල්ලංඝණය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. වගඋත්තරකාර මූලස්ථාන පොලිස් පරීක්ෂක කේ.ආර්. අජිත් ප්‍රියන්ත යන අය විසින් පැමිණිලිකාර පාර්ශවය වෙත රු. 5,000/-ක මුදලක් ගෙවිය යුතුය.

02. වගඋත්තරකරුගේ මෙම ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම සඳහා නිර්දේශයේ පිටපතක් පොලිස්පති. වෙත හා ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබේ.

2020.12.15 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 04.

සැ.යු - අදාල මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.

B/